පල්ලේපොල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 28 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) වැටුප් ප්‍රතිපූර්ණ රු.359,833 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.
(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය රු.1,529,361 ක් වැඩියෙන් දැක්වුණි.
(ඇ) සමාලෝචිත වර්ෂයේ ඉටු කිරීමට අනුමත වී නොතිබුණු රු.2,055,000 ක් වටිනා කර්මාන්ත 7 ක ඇස්තමේන්තු වටිනාකම ණය හිමියන් ලෙස ගිණුම්ගත කිරීමෙන් එම වටිනාකමින් ණයහිමියන් වැඩියෙන් ගිණුම්වල දැක්වුණි.
(ඈ) 2014 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ජී.අයි. බට 74 ක් අගයකර ගිණුම්ගතකර නොතිබුණි.
(ඉ) භෞතික පැවත්මක් නොතිබූ රු.59,641 ක් වටිනා කාර්යාලීය ජල ටැංකිය ගොඩනැගිලි ශේෂය තුළ දැක්වීමෙන් සමාන වටිනාකමින් එම ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.
(ඊ) වෙන්දේසි කළ යන්ත්‍ර 2 ක වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් රු.169,399 කින් යන්ත්‍රෝපකරණ ශේෂය වැඩියෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.5,623,945 ක් වූ ගිණුම් විෂයයන් 2 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.5,922,975ක් විය.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) ලැබියයුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 8 ක එකතුව රු.18,969,640 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින එකතුව රු.4,120,431 ක් වූ ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 13 ක එකතුව රු.11,430,366 ක්වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු.5,594,981 ක්වූ ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍යා ලිඛිත සාක්ෂි නොවීම.

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍යා තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු158,780,756 ක් වූ ගිණුම් විෂයයන් 5ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| (අ) 1893 අංක 09 දරන ගෝඝාතකාගාර ආඥාපනත | | |
| (i) 6 වගන්තිය | - | සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ගෝඝාතක වෙළඳ ව්‍යාපාරය සඳහා අදාල ආකෘතිය ප්‍රකාරව ඇප ඔප්පු ලබාදී නොතිබුණි. |
| (ii) 9 වගන්තියේ අ (2) (ආ) | - | ගෝඝාතක ව්‍යාපාරය කරගෙන යාම සඳහා තාවකාලික බලපත්‍රය ලබාදීමේදී පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii)10 වන වගන්තිය | - | ගෝඝාතකාගාරයේ එක් එක් මාසයේ මරන ලද සියලුම ගවයින් පිළිබඳ විස්තර පනතේ වගන්ති ප්‍රකාරව (ඇ) ආකෘතිය මඟින් ලබාගෙනනොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වගන්තිය | 28,960 | සමාලෝචිත වර්ෂය තුල රැස්කළ මුද්දර ගාස්තු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර 2018 අප්‍රේල් 6 වන විටත්, පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | |
| | (i) 217 රීතිය | - | පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) 218 රීතිය | - | වසම් 44 කින් වසම් 16 ක ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණ කටයුතු නිමකර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 365,351 | කර්මාන්ත රැඳවුම් මුදල් සහ 2011 වර්ෂයේ සිට අක්‍රීය කිරවනැල්ල ජල යෝජනා ක්‍රමයේ ජල තැන්පත් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. |
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | වාහන 7 ක වර්ෂ ගණනාවක සිට ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඊ) | චක්‍රලේඛ හා වෙනත් | | |
| | (i) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ උප ලේඛන A 'අ' කොටසේ 31 වගන්තිය | - | සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන ගෝඝාතකාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |
| | (ii) පළාත්පාලන කොමසාරිස්ගේ 2017 අගෝස්තු 03 දිනැති අංක 2017/03 දරන චක්‍රලේඛය | - | සභාව විසින් විධිමත් නඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,277,901 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,247,515 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,900,000 | 5,748,132 | 5,535,964 | 1,711,579 | 4,785,090 | 4,970,013 | 4,964,179 | 1,518,337 |
| (ii) | කුලී | 442,400 | 456,359 | 466,360 | - | 600,000 | 997,275 | 977,850 | 19,425 |
| (iii) | බලපත්‍ර | 700,000 | 607,520 | 626,945 | - | 600,000 | 997,275 | 977,850 | 19,425 |
| (iv) | වෙනත් ආදායම් | 20,184,000 | 12,906,771 | 10,464,833 | 7,019,924 | 14,356,000 | 13,379,423 | 8,187,912 | 10,666,638 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ අයවැය ලේඛනය අනුව බහුකාර්ය ගොඩනැගිල්ල කුලියට දීමෙන් රු.4.200,000 ක ආදායමක් ඇස්තමේන්තුගත කළද කිසිදු මුදලක් උපයාගෙන නොතිබුණි.

2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.237,567 ක් වූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(i) වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ වරිපනම් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ අක්කර බදු ශේෂය රු.36,070 ක් විය.

(ඇ) ජල ගාස්තු

-----------

(i) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.1,437,941 ක් විය.

(ii) සභාව විසින් ජල යෝජනා ක්‍රම 5 ක් යටතේ ජලය බෙදා හරින පාරිභෝගිකයින් 1,078 දෙනෙකු සඳහා ජල මනු සවි නොකර රු.100 ක මාසික ස්ථාවර ගාස්තුවක් අයකරමින් පැවතුණි.

(iii) ජල සැපයුම ක්‍රියා විරහිතව ඇති පාරිභෝගිකයින් 158 ක ගෙන් හා ජල සැපයුම විසන්ධි කල පාරිභෝගිකයින් 55 ක ගෙන් රු.373,811 ක හිඟ ජල ගාස්තු ශේෂයක් අයකළ යුතුව පැවතුණි.

(iv) නිසි පරිදි ජල මනු සවිකර නොකිරීම නිසා අදාළ ගාස්තු ආදායම වැඩිකර ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.744,456 ක් හා මුද්දර ගාස්තු රු.9,922,182 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

---------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 4 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවියයුතුව තිබූ නමුත් එකී අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------

(i) සභා අරමුදල් යටතේ ඉටු කිරීමට යෝජිතව තිබූ අනුමත ප්‍රතිපාදන මුදල රු.1,600,000 ක් වූ කර්මාන්ත 4 ක වැඩ අවසන් වී නොතිබුණු අතර, අනුමත ප්‍රතිපාදන මුදල රු.700,000 ක් වූ සභා කර්මාන්ත 3 ක් ඉටු කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ii) සභා අරමුදල් යටතේ ඉටු කිරීමට යෝජනා කළ රු.630,000 ක් වටිනා කර්මාන්ත 6 ක් ප්‍රමාද කොට අනුමැතියට යැවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අනුමැතිය ලබා ගැනීමට හෝ ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

-----------------------------

සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂයන් තුළදී කර්තව්‍යයන් දෙකක් ආරම්භකර ඒ සඳහා රු.926,357 ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. විස්තර පහත දැක්වේ

| | කර්තව්‍යය | 2017.12.31 දක්වා වැයකළ මුදල | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ----------- | --------------- | ----------- |
| | | රු. | |
| (i) | 2015 නගර සංවර්ධන වැඩසටහන යටතේ රු.2,500,000 ක අනුමත ප්‍රතිපාදන මත නාගරික රැස්වීම් ශාලාව වැඩිදියුණු කිරීම | 677,033 | රු.2,112,125 කට ගිවිසුම්ගත වී රු.2,123,341 ක අවසන් බිල්පත් ඉදිරිපත්කර තිබූ නමුත් කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් ගැටළු හේතුවෙන් රු.677,033 ක් පමණක් ගෙවීම් කර 2016 සිට ඉදිකිරීම් නවතා දමා තිබුණි. |
| (ii) | නගර සංවර්ධන වැඩසටහන යටතේ 2015 වර්ෂයේදී රු.1,500,000ක ප්‍රතිපාදන මත තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය | 249,324 | i. 20%ක අත්තිකාරමක් අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ නමුත් 2016 වර්ෂය අවසාන වනවිට රු.169,128 ක වැඩ කොටස් පමණක් නිමකර කර්මාන්තය නවතා තිබූ බැවින් සභාවට රු.80,196 ක පාඩුවක් සිදුව තිබුණි.<br><br>ii. ගිවිසුම් ප්‍රකාරව අයවියයුතු රු.119,787 ක ප්‍රමාද ගාස්තුවක් අයකරගෙන නොතිබුණි.<br><br>iii. ගොඩනැගිල්ල වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.350,000 ක් සභා අරමුදලින් වැයකර කඩ කාමර 2ක් ලෙස නිම කිරීමට කටයුතු කලද, එය ද අසම්පූර්ණව ඉටුකිරීම හේතුවෙන් අදාළ ගොඩනැගිල්ල අභාවිතව පැවතුණි. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

(i) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2015 හා 2016 වර්ෂවල පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ රු.1,329,560 ක් වැයකර කොම්පෝස්ට් අංගනයක් හා අඩක් නිමි ගබඩා කාමරයක් ඉදිකර තිබුණද, ජල හා විදුලි පහසුකම් නොමැති වීම හේතුවෙන් එකී මධ්‍යස්ථානය විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ii) සභාබල ප්‍රදේශයේ දෛනිකව කසළ ට්‍රැක්ටර් ලෝඩ් 1 ක් පමණ එකතු කරනු ලබන අතර, පොහොර නිෂ්පාදන කටයුතු කිරීමට ප්‍රමාණවත් පහසුකම් හා සැලසුම් නොතිබුණි.

(iii) බෝතල් ආදිය බැහැර කිරීමට ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබූ අතර, අවශේෂ කොටස් විධිමත්ව බැහැර නොකර එම ස්ථානයේදීම පිළිස්සීමට කටයුතු කර තිබුණි.

(iv) පර්චස් 60 ක් පමණ වූ අදාළ භූමිය අසල නිවාසද පිහිටා තිබීමෙන් පාරිසරික ගැටළුද උද්ගත විය හැකිව තිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක
--------------------------
තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස සපුරාගතයුතු ඉලක්කයන්, එම ඉලක්ක සපුරා ගැනීම සඳහා පවතින ගැටළු මෙන්ම අදාළ අරමුණු ලඟාකර ගත් ප්‍රමාණය මැන ගැනීම සඳහා සුදුසු දර්ශකයන් හඳුනාගෙන තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟාවීමට කටයුතු කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ එසේ කටයුතුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ආයුර්වේද ගොඩනැගිලි 2 ක් පැවති නමුත් බලප්‍රදේශයට ආයුර්වේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මිල්ලවාන ප්‍රදේශයේ පිහිටි සභා ගොඩනැගිල්ලක පවත්වාගෙනයන පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අලෙවිසැලකින් වර්ෂ ගණනාවක සිට අයවියයුතුව පවතින රු.20,000ක හිඟ කුලී අයකර ගෙන නොතිබුණු අතර, 2014 වර්ෂයේ කඩා ඉවත් කළ පොදු වෙළඳපල කඩ 2 ක හිඟ කඩකුලී රු.38,000 ක් නිරවුල් කරගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) පරිසර බලපත්‍ර ලබා ගැනීමේ කාලසීමාව ඉකුත් වී තිබූ ව්‍යාපාර 11 ක් සඳහා අදාළ පරිසර බලපත්‍ර අලුත් කිරීමට කටයුතු නොකර ව්‍යාපාර පවත්වාගෙන යාමට ඉඩ හැර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් කළ ගොඩනැගිලි අයදුම්පත් 74කින් 34 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණ නමුත් ඉන් අනුකූලතා සහතික ලබාගෙන තිබුණේ 11 දෙනෙකු පමණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
--------------------------------
(අ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සේවකයින් 18 දෙනෙකු වෙත ස්ථිර පත්වීම් ලිපි ලබා දී වසර 3 ක් ගතවී තිබුණද සේවය ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මෙම සේවකයින් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට වැන්දඹු අනත්දරු වාරික ලෙස රු.457,143 ක් ප්‍රේෂණය කර තිබුණද, වැන්දඹු අනත්දරු අංක ලබා දීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) එකී සේවකයින් 12 දෙනෙකුගේ අධ්‍යාපන සුදුසුකම් සනාථ කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 ජූලි 20 දිනැති අංක 02/2011 (සංශෝධිත 1) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1.2 හා 1.3 ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු රු.273,516ක සේවක අර්ථ

සාධක අරමුදලේ සහාදායකය අදාල සේවකයාට ගෙවා තිබූ අතර, ඔහුට විශ්‍රාම වැටුප් / වැන්දඹු අනත්දරු හිමිකම ප්‍රදානය කිරීම පැහැර හැර තිබුණි.

(ඉ) 2009 වර්ෂයේ පත්වීම් ලබාදුන් පුස්තකාල සහායකයෙකු නිවැරදි නොවන වැටුප් තලයක පිහිටුවීම හේතුවෙන් 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සභා අරමුදලින් වැඩිපුර ගෙවා තිබූ වැටුප් රු.131,884 ක් විය.

(ඊ) සභාවට අදාළ ද්විතීය හා ප්‍රාථමික තනතුරු 54 ක පුරප්පාඩු 23 ක් පැවතීමෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට නොහැකි තත්ත්වයකට පත්වී තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සිය බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පොදු පරිපාලන අධිකාරිය ලෙස සභාව කටයුතු කළයුතු වුවත්, සභා බල ප්‍රදේශය තුළ සභාව මඟින් නඩත්තු කරන ජල යෝජනා ක්‍රම 5 කින් හා ප්‍රජා මූල සංවිධාන මඟින් පාලනය වන ජල ව්‍යාපෘති 24 කින් ජල යෝග්‍යතා පරීක්ෂණ සිදුකර තිබුණේ ව්‍යාපෘති 13 ක පමණි.
පරීක්ෂාවට ලක්කර තිබූ ජල යෝජනා ක්‍රම 8 ක ජලය පානයට නුසුදුසු මට්ටමක පැවති නමුත් පිරිපහදු ක්‍රියාවලියකට යොමු වී එම නුසුදුසු භාවයට පිළියම් යෙදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඉදරිපත් කළ නිර්දේශය අනුව සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ පොත් 226 ක වටිනාකම වූ රු.40,554 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ZA- 5036 දරන බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කළපසු 2016 අගෝස්තු මස සිට අවශ්‍යතාවය මත සභාවේ රියදුරෙකු යොදවා කුලී පදනමට ලබාදුන් අවස්ථා පැවතියදී සමාලෝචිත වර්ෂය තුළ රු.21,750 ක් වැයකර පිටතින් යන්ත්‍රයක් කුලියට ලබාගෙන තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

------------------------------

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

--------------------------------------------

පුද්ගලයෙකු විසින් විකුණුම්කරයකින් 2010 වර්ෂයේදී සභාවට පවරා දී තිබූ පල්ලේපොල අකුරම්බොඩ මහායායවත්ත අරඹේයාය කොස්ගහමුලවත්ත ඉඩමේ වැට මායිම් යොදා අයිතිය තහවුරු කර නොගැනීම හේතුවෙන් පෞද්ගලික පාර්ශවයක් අනවසර ලෙස පදිංචි වී තිබූ අතර , දේපල අත්පත් කර ගැනීමට නීති මාර්ගයට යොමු වීමට සිදුවී තිබුණි.

3.5.2 පවරා නොගත් වත්කම්

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නගර සංවර්ධන වැඩසටහන යටතේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු.67,424,443 ක පිරිවැයක් දරා ඉදිකර සභාවට පවරා දී තිබූ බහු කාර්ය ගොඩනැගිල්ල පිහිටි භූමිය නිසි පරිදි පවරා ගෙන නොතිබීමෙන් එම භූමියේ පිහිටි පැරණි නිවසක පදිංචිකරුවන් ඉවත්කර සභාවට නිරවුල් අයිතිය ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2006 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් බදු පදනමට සභාවට ලබාදී තිබූ අකුරම්බොඩවත්ත ඉඩමෙන් අක්කර 2 රූඩ් 3 පර්චස් 37 ක් සභාවේ ක්‍රීඩාංගනය ලෙස භාවිතා කර තිබූ අතර, 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභාව බදු මුදල් නොගෙවීම මත රු.2,358,311ක හිඟ බදු කුලී ශේෂයක් හා 10% ක අධිභාරයක් අයකරන බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දන්වා තිබුණි.

3.5.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.3,632,510 ක් වැයකර 2015/2016 වර්ෂවලදී ඉදිකර තිබූ පල්දෙණිය තඹහිටියාව ආදාහනාගාරයේ වැඩ අවසන් නොකිරීම හා රු.2,972,240 ක් වැයකර 2014 හා 2015 වර්ෂවලදී ඉදිකර තිබූ ටී.බී.තෙන්නකෝන් ළමා උද්‍යානය භාවිතා නොකිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට අභාවිතව අබලි තත්ත්වයේ පැවති එකතු වටිනාකම රු.884,400 ක්වූ වාහන 2 ක් හා රු.143,000 ක් වටිනා කොන්ක්‍රීට් ඇඹරුම් යන්ත්‍රයක් නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2015 වර්ෂයේ ඊ නැණ පියස පරිගණක මධ්‍යස්ථානයක් ඇති කිරීමට මිලදීගෙන තිබුණු පරිගණක 2 ක් අභාවිතව ගබඩාවේ රඳවා තිබුණි.

(ඈ) 2015 වර්ෂයේදී රු.469,000 ක් වැයකර ඉදිකරන ලද නල ළිඳට ජල පොම්පයක් සවි නොකිරීම හේතුවෙන් අභාවිතව පැවතුණි.

(ඉ) 1996 වර්ෂයේ විවෘත කර 2013 වර්ෂයේ සිට අක්‍රියව පවතින මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක සමාලෝචිත වර්ෂය අවසානයට රු.35,344 ක ශේෂයක් පැවතුණි.

(ඊ) වටිනාකම රු.859,670 ක් වූ ජල මෝටර් 2 ක් , ෆැක්ස් යන්ත්‍රයක් හා ඡායා පිටපත් යන්ත්‍රයක් නිෂක්‍රීයව පැවතුණි.

3.5.4 වාහන උපයෝජනය

------------------------

අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ වාහන 3 ක් ප්‍රයෝජනයට ගැනීමට නොහැකිව සභා අරමුදලින් රක්ෂණ ගාස්තු දරමින් සභාවේ රඳවා තිබුණි.

3.6 හඳුනාගත් අලාභ

------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) නඩු තීන්දුව ප්‍රකාරව සභාව නිවැරදිකරු වී තිබූ අංක MR.6260 දරන නඩුව සඳහා 2016 මැයි 13 දක්වා නීතිඥ ගාස්තු ලෙස දැරූ රු.225,270 ක් පැමිණිලි පාර්ශවයෙන් අයකර ගැනීමට නියමිතව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ආ) අංක ZA – 5036 දරන බැකෝ යන්ත්‍රය 2015 වර්ෂයේ අනතුරට පත්වී තිබූ නමුත් අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104 යටතේ පැවැත්වියයුතු පරීක්ෂණය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, පවත්වා වැරදිකරුවන් හඳුනාගෙන නොතිබූ අතර, යන්ත්‍රයේ අලුත්වැඩියාව සඳහා

රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය නොවූ රු.406,739ක් හා හානි වූ නිවස පිළිසකර කිරීමට රු.262,909 ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

3.7 ප්‍රසම්පාදනය

----------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ රු.1,253,295 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 අනුව ප්‍රසම්පාදන කාලසටහනක්ද පිළියෙල කර නොතිබුණි.

3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පල්ලේපොල බහුකාර්ය ගොඩනැඟිල්ල ඉදිරිපිට මාර්ග කාණු පද්ධතිය ඉදිකිරීම.

------------------------------------------------------------------------------------

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී. 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017 යටතේ යථෝක්ත ව්‍යාපෘතියේ කොටසක් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් පිළියෙල කළ රු.3,200,000ක ඇස්තමේන්තුවක් මත මිල ගණන් කැඳවා තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ රු.2,615,658 කට කර්මාන්තය ඉටු කිරීමට ගිවිසුම්ගතව 2017 දෙසැම්බර් 22 දින වැඩ නිමකර රු.2,579,874 ක් බිල්කර තිබුණි.

කර්මාන්තයට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා බිල් කිරීම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ඉංජිනේරු ඇස්තමේන්තුවේ 1,2 හා 3 වැඩ විෂයයන් සඳහා වන රු.60,000 ක ඇස්තමේන්තුගත මිල ලංසු ලේඛනවල සාවද්‍ය ලෙස රු.600,000 ක් ලෙස මුද්‍රණය කර දක්වමින් මිල කැඳවා එකී සාවද්‍ය වටිනාකම පදනම් කරගනිමින් මිල ගණන් ඇගයීමට ලක්කර තිබුණි.

(ආ) තෝරාගත් කොන්ත්‍රාත්කරු පමණක් එම වටිනාකම රු.180,000 ක් ලෙස අඩුවෙන් දක්වා තිබූ බැවින් අඩුම මිල ඉදිරිපත් කිරීම මත ඔහු තෝරාගෙන තිබූ අතර, සාවද්‍ය ලෙස දක්වා තිබූ රු.600,000 ක මිල නොසලකා හැරි විට ඔහු විසින් ඉදිරිපත් කළ සමස්ථ කොන්ත්‍රාත් මිල අඩුම මිල නොවීය.

(ඇ) ඇස්තමේන්තු සකස් කිරීමේදී මහා මාර්ග උපලේඛන අනුපාත ( HSR) භාවිතා කර පිරිවිතරයන් සකස්කර තිබූ අතර, ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 7 හි ST-047 සඳහන් පිරිවිතරයට අනුව HSR මිල ගණන රු.14,714 ක් වුවද, ඒ සඳහා රු.17,277ක් ලෙස රු.2,564 ක් වැඩියෙන් ඇස්තමේන්තු කර තිබුණි.

(ඈ) තෝරාගත් ලංසුකරු විසින් එම වැඩ විෂය සඳහා රු.24,423 ක ඒකක මිලක් ඉදිරිපත්කර තිබූ අතර, එවැනි වැඩි වටිනාකමක් ඉදිරිපත් කිරීමට අදාළව මිල විශ්ලේෂණයක් ඉල්ලීම මඟින් සාධාරණීයත්වය ඇගයීමකින් තොරව වැඩි ඒකක මිල ගෙවීමට එකඟ වී තිබුණි.

(ඉ) ඒ අනුව මෙම කර්මාන්තයේ ප්‍රසම්පාදන කටයුත්තට අදාල තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4, 2.5 සහ 2.6 ඡේද පරිදි

සිය වගකීම් හා කාර්යභාරය නිසි ලෙස ඉටුකර නොමැති බව හා උපරිම ආර්ථික වාසි හා සාධාරණීයත්වය යන පදනම් වලින් බැහැරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

(ඊ) රු.60,000 ක ඇස්තමේන්තුගත වැඩ විෂයයන් සඳහා ලංසු ලේඛනවල රු.600,000 ක ව්‍යාජ වටිනාකම් දැක්වීම හා ඒ සඳහා රු.164,215 බිල්කර ගෙවීමට නිර්දේශ කිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවූ හා ඉටුකළ බවට තහවුරු කිරීම් නොමැති වූ රු.104,215 ක සාවද්‍ය බිල් කිරීමක් නිර්දේශ කර තිබුණි.

(උ) කිසිදු සාධාරණ ඇගයීමකින් තොරව වැඩ විෂය අයිතම 7 සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවෙන් 41% ටත් වඩා වැඩි අගයක් ඉක්ම වූ රු.24,432 ක ඒකක මිලක් ගෙවීමට එකඟව ඒ සඳහා රු.994,400 ක බිල්කිරීම හා එකී බිල් කිරීම් නිවැරදි බවට නිර්දේශ කිරීම තුළින් ඇස්තමේන්තුව ඉක්මවූ රු.285,643ක සාවද්‍ය බිල් කිරීමක් නිර්දේශ කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 8 ක ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ආදායම් විෂයයන් 16 ක සියයට 13 සිට සියයට 99 අතර පරාසයකින් ඉලක්කගත ආදායම් උපයා ගැනීමට සමත් වී නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 21 ක ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා සියයට 11 සිට සියයට 1088 දක්වා පරාසයක ආදායම් උපයාගෙන තිබුණි.

(ඇ) වැය විෂයයන් 21 ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 38 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සිපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය හා 2014 අගෝස්තු 01 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක සීපීසී/සීඑම්සී/1/6 දරන ලිපිය ප්‍රකාරව කාර්තුවකට 1 බැගින් අවස්ථා හතරකදී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් අවස්ථාවකදී පමණක් කමිටුව පවත්වා තිබුණි.

## 5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ----------- | | --------------------- |
| (අ) | ණයගැති /ණයහිමි | (i) | ණය ගැතියන්ගෙන් මුදල් අයකර නොගැනීම. |
| | | (ii) | ණය හිමියන් නිරවුල් නොකිරීම. |
| | | (iii) | ණයහිමියන් වැඩිපුර ගිණුම්ගත කිරීම. |
| (ආ) | වත්කම් / දේපල | (i) | වත්කම් නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | වත්කම්වල වටිනාකමේ නිවැරදිතාවය සනාථ නොවීම. |
| | | (iii) | වත්කම් ඌන උපයෝජනය හා නිෂ්ක්‍රීයව පැවතීම. |
| (ඇ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම. |
| | | (ii) | ආදායම් ඉලක්ක සපුරා නොගැනීම. |
| (ඈ) | වාහන පාලනය | (i) | ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම |
| | | (ii) | වාහන ඌන උපයෝජනය හා නිෂ්ක්‍රීයව පැවතීම |

# පටුන

--------


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | කාර්යභාර නියමතා පත්‍රය | 01 |
| 02 | ගිණුම සමඟ ඉදිරිපත් කළ උප ලේඛනය | 02 - 63 |
| 03 | පොදු ලෙජරය | 64 - 102 |
| 04 | ජ'නල් සටහන් | 103 - 113 |
| 05 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 114 - 115 |
| 06 | ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය | 116 |
| 07 | ශේෂ පත්‍රය හා ශේෂ පත්‍ර සටහන් | 117 - 124 |
| 08 | ආදායම් වියදම් ගිණුම | 125 |
| 09 | ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශය | 126 |
| 10 | විගණන වැඩ පත්‍රිකා | 127 - 153 |
| 11 | කෙටුම්පත් වාර්තාව | 154 - 184 |